

(c) Sumitha Publishers



තක්සලා නුවර පුරාණ ඉන්දියාවේ
සුප්‍රසිද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයක් විය.
මෙහි එක්තරා උගත් බමුණෙක් වාසය කළේය.
ඔහු 'නන්දිවිසාල' නම් වසු පැටවෙකු හදාවඩා ගත්තේය.
කල් යත්ම නන්දිවිසාල හොඳ ශක්තිමත්
ගොනෙකු බවට පත් විය.
තමාට ආදරයෙන් කවා පොවා රැක බලා ගන්නා බමුණාට
නන්දිවිසාල ද බෙහෙවින් ආදරය කළේය.

දවසක් නන්දිවිසාල මෙසේ සිතුවේය:
'මගේ හාම්පුතා මා හොඳින් හදා වඩා ගත්තා.
දැන් මම හොඳ හැඩි දැඩි ගොනෙක්.
මේ කෙළෙහි ගුණ පෙන්වන්ට හොඳ ම කාලය යි'

(c) Sumitha Publishers



(c) Sumitha Publishers

ගොනා බමුණා වෙතට ගොස් මෙසේ කීවේය:
"බමුණානෙනි, ඔබ ගොන් පට්ටියක් ඇති බමුණෙකු සොයා යන්න.
ඔහුට කියන්න මේ නගරයේ සිටින
ශක්තිමත් ම ගොනා සිටින්නේ තමා ළඟ බව.